# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

වී. සෝමරත්න
ඉන්ධන පිරවුම්හල ඉදිරිපිට
නවනගරය
ගල්නෑව

<u>**අභියාචක**</u>

**අභියාචනා අංකය : 1007/2021**

**එදිරිව**

ප්‍රාදේශීය සභාව
ගල්නෑව

<u>**පොදු අධිකාරිය**</u>

**ඉදිරිපිටදී** :

1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** :

අභියාචකගේ නියෝජිත පී.වී. ධනපාල මහතා ZOOM තාක්ෂනය ඔස්සේ පෙනී සිටී.

පොදු අධිකාරිය වෙනුවෙන් ආර්.කේ ආඹගල මිය (නම් කළ නිලධාරි) ZOOM තාක්ෂනය ඔස්සේ පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම්** :

අභියාචක - ඉදිරිපත් කර නැත

පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත

**විභාග කළ දිනය** : 2022.05.18, 2022.06.22, 2022.08.04

**තීරණය කළ දිනය** : 2022.08.04

<u>**කොමිෂන් සභාවේ තීරණය**</u>

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක 2021.07.10 දිනැති තොරතුරු ඉල්ලීම මගින් ලේඛන දෙකකින් පහත තොරතුරු ඉල්ලා ඇත.

<u>*පළමු ලේඛනය*</u>

*1. පැරණි වෙළඳ සංකීර්ණයේ පහත මාලයේ කඩකාමරය සඳහා අලුතින් දොරවල් සවිකිරීමට අදාළව එහි බදුකරුවන් වෙත නව ඉදිකිරීම් සඳහා සභාව මගින් අවසර දෙන ලද 2016-2017 වර්ෂවලදී ගන්නා ලද කමිටු තීරණ පිළිබඳ සත්‍ය පිටපත්*
*2. පැරණි වෙළඳ සංකීර්ණයේ අංක දහය හා එකොළහ කඩකාමර සඳහා එහි බදුකරුවන් සමග පළමුව ගිවිසුම් අත්සන් කළ දිනය හා අවසන් වරට ගිවිසුම් අත්සන් කළ දිනය හා එහි වළංගු කාලය පිළිබඳ සත්‍ය පිටපත්*
*3. පැරණි වෙළඳ සංකීර්ණයේ අංක එක අතුරු කාමරය සඳහා එහි බදුකරු සමග පළමුව ගිවිසුම් අත්සන් කළ හා පළමුව මාසික බදු කුලිය ලබාගත් දිනය පිළිබඳ සත්‍ය පිටපත්*
*4. පැරණි වෙළඳ සංකීර්ණයේ අංක පහළොව කඩකාමර සඳහා එහි බදුකරු සමග පළමුව ගිවිසුම් අත්සන් කළ දිනය හා අවසන් වරට ගිවිසුම් අත්සන් කළ දිනය එහි වළංගු කාලය ගිවිසුම්කරුගේ නම හා අවසන්වරට මුදල් ගෙවා ඇති ලදුපතේ සත්‍ය පිටපත්*
*5. පැරණි වෙළඳ සංකීර්ණයේ අංක දාහතර කඩකාමර සඳහා එහි බදුකරු සමග පළමුව ගිවිසුම් අත්සන් කළ දිනය හා අවසන්වරට ගිවිසුම් අත්සන් කළ දිනය හා අවසන්වරට මුදල් ගෙවා ඇති ලදුපතේ සත්‍ය පිටපතක්*
*6. ප්‍රාදේශීය සභාවට අයත් බුල්නෑව වෙළඳ සංකීර්ණයේ කඩකාමර ලබා දී ඇති ආකාරය සහ එහි බදුකරුවන්ගේ නම් සහ ලබා දී ඇති බදුකාලය පිළිබඳ සත්‍ය පිටපත්*
*7. බුල්නෑව වෙළඳ සංකීර්ණයේ කඩකාමර බදුදීමට පෙර ඒ සඳහා අනුමැතිය ලබාගත් මහසභා තීරණ ඇතුළත් සම්පූර්ණ සත්‍ය පිටපත්*

*<u>දෙවන ලේඛනය</u>*

*1. නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 2019-2020 වර්ෂ සඳහා බදු දීමට අදාලව ටෙන්ඩර් කැඳවීම සඳහා පලකරන ලද පුවත්පත් දැන්වීමේ හා එයට අදාළ කොන්දේසි මාලාවේ සත්‍ය පිටපත්*
*2. නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක එකේ සිට පහළොව දක්වා ලබාගත් ය හා ඔහු කී වෙනි ලංසු කරුද ලංසු මුදල පිළිබඳ සත්‍ය පිටපත්*
*3. නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක එකේ සිට පහලව දක්වා ලබාගත් අය විසින් ලංසු මුදලින් දැනට ගෙවා ඇති මුදල හා ගෙවීමට ඇති හිඟ මුදල් හා ගෙවා ඇති මුදලට අදාළ ලදුපත් වල සත්‍ය පිටපත්*
*4. 2020 ජනවාරි මස සිට දෙසැම්බර් දක්වා පවත්වන ලද මහසභා වලදී ගන්නා ලද තීරණ සහිත සම්පූර්ණ සභා වාර්තාවල සත්‍ය පිටපත්*
*5. 2021-05 වන මස පැවති මහසභා වේදී ගන්නා ලද තීරණ සහිත සම්පූර්ණ සභා වාර්තාවේ සත්‍ය පිටපත්*
*6. 2021-06 වන මස පැවති මහසභා වේදී ගන්නා ලද තීරණ සහිත සම්පූර්ණ සභා වාර්තාවේ සත්‍ය පිටපත්*
*7. නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 2019-2020 වර්ෂ සඳහා බදු දීමට අදාළව ටෙන්ඩර් කැඳවීමට පෙර ඒ සඳහා අනුමැතිය ලබාගත් මහසභා තීරණ ඇතුළත් වාර්තාවක සම්පූරණ සත්‍ය පිටපත්.*
*8. බුල්නෑව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර ලබාගෙන ඇති බදු කරුවන්ගේ නම් හා ලිපිනයන්*

මෙම තොරතුරු ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් තොරතුරු නිලධාරි විසින් 2021.08.03 දින පහත ප්‍රතිචාරය දක්වා ඇත.

*ඔබ විසින් 2021.07.19 දින ඉදිරිපත් කරන ලද ලියාපදිංචි අංක 12/21 දරන තොරතුරු ඉල්ලීමේ පනතේ 5 වන උප වගන්තියේ විධිවිධාන අනුව පහත සඳහන් කර ඇති හේතු මත/ඉල්ලා ඇති තොරතුරු දැනටමත් පහත පරිදි ප්‍රසිද්ධියට පත්කර ඇති හේතුව මත/ඉල්ලා ඇති තොරතුරු අප*

*අධිකාරියෙහි පාලනය හෝ භාරයෙහි නොමැතිවීමේ හේතුව මත ප්‍රතික්ෂේප කරන ලද බව දන්වමි.*

*විභාග වෙමින් පවතින නඩුවකට අගතියක් විය හැකි බැවින් ඉල්ලා ඇති තොරතුරු ලබාදිය නොහැක.*

මෙයින් අතෘප්තියට පත් අභියාචක 2021.08.06 දින නම් කළ නිලධාරි වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත. නම් කළ නිලධාරි විසින් 2021.08.20 දින මීට අදාලව පහත ප්‍රතිචාරය දක්වා ඇත.

*ගල්නෑව ප්‍රාදේශීය සභාවට අයත් වෙළඳ සංකීර්ණය සම්බන්ධයෙන් අධිකරණ දෙකක නඩු කටයුතු සිදුවන බැවින් මෙම තොරතුරු ලබාදීමට නො හැකි බව කාරුණිකව දන්වා සිටිමි.*

මෙම පිළිතුරෙන්ද අතෘප්තියට පත් අභියාචක 2021.09.29 වන දින කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය ඉදිරිපත් කර ඇත.

**සළකා බැලීම**

තොරතුරු මුදාහැරිම ප්‍රතික්ෂේප කිරීමට හේතු සනාථ කරන ලෙසට පොදු අධිකාරියට අවස්ථාව ලබා දී ඇතත් අද දින ඉදිරිපත් කරන ලද 14.07.2022 ලේඛනයෙන් එවැනි ඔප්පු කිරීමක් සිදුවී නොමැත. එකී ලේඛනයේ 5 සහ 6 ඡේදයන්හි සඳහන් කර ඇති අන්දමට අභියාචක මහේස්ත්‍රාත් අධිකරණයේ නීතීඥයෙකු වශයෙන් පෙනී සිටීම හෝ තොරතුරු ඉල්ලීම සිදු කර ඇත්තේ නඩුවට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය ලේඛන ලබා ගැනීමට යන කරුණු කිසිවක් තොරතුරු ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීම සඳහා තොරතුරු පනතේ 5 (1) වගන්තියෙහි අන්තර්ගත වන හේතූන් නොවේ. එබැවින් පොදු අධිකාරිය විසින් තොරතුරු මුදා හැරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා ගෙන ඇති ස්ථාවරය සමග එකඟ වීමට නීතිමය හැකියාවක් නොමැත.

එබැවින් උක්ත කරුණු සලකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති උක්ත දින දරන තොරතුරු ඉල්ලීමේ අඩංගු සියලුම 30.08.2022 දිනට ප්‍රථම කොමිෂන් සභාවට පිටපත් සහිතව අභියාචක වෙත මුදා හරින ලෙස කොමිෂන් සභාව තීරණය කරමු.

එසේ තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියට සහ තොරතුරු නිලධාරිට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.